(2) (1) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබූ සෑම බැඳුම්කරයකට ම ශ්‍රී ලංකා මහබැංකුව විසින් නිකත් කරන ලබන මධ්‍ය කාලීන රජයේ බැඳුම්කර වෙනුවෙන් තත්කාලයෙහි ගෙවනු ලබන්නා වූ පොලී අනුපාතය අනුව පොලියක් නියම කර තිබිය යුතු අතර එම බැඳුම්කර --

(අ) 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරිමේ පනතේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ එම සමාගම සම්බන්ධයෙන් නියමයක් කරනු ලැබූ දින සිට අවුරුදු දහයක කාලයක් අවසන් වීමෙන් පසුව ; හෝ

(ආ) එම සමාගමේ එවැනි සේවකයකුගේ සේවය ( විශ්‍රාම යාම, මිය යාම නීතිය ක්‍රියාත්මක වීම හෝ අන්‍යාකාරයකින් ) අවසන් වීමේ දී ; හෝ

(ඇ) එවැනි සමාගමක කොටස් මුදල් විකිණීම සඳහා මහජනයා වෙත මුලින් ම ඉදිරිපත් කරනු ලැබූ දිනය

යන දින වලින් කලින්ම එළඹෙන දිනයේ දී මුදල් බවට පරිවර්තනය කරනු ලැබිය යුතුය.

(3) විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ සමාගමේ යම් කොටස් මුදලක් මිලදී ගැනීමේ කාර්ය ස ඳහා (1) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබූ යම් බැඳුම්කරයක් එහි කාලය අවසන් වීමට පෙර එය දරන්නා විසින් භාරදෙනු ලැබිය හැකිය.

(4) එවැනි සෑම බැඳුම්කරයක්ම නියම කරනු ලැබිය හැකි ආකාරයට සහ නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව නිකුත් කරනු ලැබිය යුතුය.

7 ආ. නියම කරනු ලැබිය යතු බවට මේ පනත රීති මගින් අවශ්‍ය යම් කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් රීති සාදනු ලැබිය හැකිය.

7 ඇ. රාජ්‍ය සංස්ථාවක කර්තව්‍ය පවරා ගන්නා වූ හෝ රජයට පවරා ගත් ව්‍යාපාර ආයතනයන් පවරා ගෙන පවත්වා ගෙන යන්නා වූ හෝ සමාගමක සේවකයකු, මේ පනතේ 5(1) වන වගන්තියේ කාර්යයන් සඳහා ඒ සමාගමේ අවුරුදු පහක සේවය සම්පූර්ණ කර සිටීද යන්න තීරණය කිරීමේ දී රාජ්‍ය සංස්ථාවෙහි හෝ රජයට පවරා ගත් ව්‍යාපාර ආයතනයෙහි හෝ ඔහුගේ සේවා කාලය ඇතුළත් කර ගනු ලැබිය යුතුය.

3. මේ පනතේ ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනය 1987 මැයි මස 15 දින සිට ක්‍රියාත්මක වන ලෙස සියලු කාර්ය ස ඳහා සලකනු ලැබිය යුතුය.

## III වන කොටස

## පොදු විධිවිධාන

8. (1) මේ පනත යටතේ පාරිතෝෂිකය වශයෙන් ලැබිය යුතු යම් මුදලක් ගෙවීමෙහි ලා යම් පැහැර හැරීමක් කරනු ලැබ ඇති අවස්ථාවක, හෝ මේ පනත යටතේ ලැබිය යුතු පාරිතෝෂිකය 4 වන වගන්තියේ විධිවිධාන යටතේ හෝ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 17 වන වගන්තියේ (5) වන උපවගන්තියේ විධිවිධාන යටතේ හෝ අය කර

